අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
Ministry of Education, Higher Education and Vocational Education 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/16/02/06/01/2/2026

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2026.05.29

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත

**මෙනින්ජයිටිස් රෝග ව්‍යාප්තිය වැළැක්වීම සඳහා පාසල් බලධාරීන් දැනුම්වත් කිරීම.**

මේ දිනවල ඇතැම් දිස්ත්‍රික්කවල පැතිර යන එන්ටරෝවෛරස මෙනින්ජයිටිස් නම් රෝගය පිළිබඳව ක්‍රියා කළ යුතු ආකාරය සම්බන්ධයෙන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය දැනුම්වත් කර ඇත.

02. වෛරස් මෙනින්ජයිටිස් (මස්තිෂ්ක පටල ප්‍රදාහය) යන රෝගය වෛරස් මඟින් ඇතිවන රෝගයක්වන අතර එන්ටරෝවෛරසය ඒ සඳහා ප්‍රධාන හේතුවක් වේ. මෙම රෝගය ළමුන්ට හා ප්‍රතිශක්තිය අඩු පුද්ගලයන්ට වැඩි වශයෙන් බලපෑම් සිදු කරයි. එන්ටරෝවෛරස් මෙනින්ජයිටිස් රෝගය වැළඳුනු රෝගීන් 2026 වසරේ අප්‍රේල් මාසයේ දී, මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රදේශයෙන් වාර්තා වූ අතර, මේ වන විට නුවර එළිය, මහනුවර හා බදුල්ල යන දිස්ත්‍රික්කවල ද මෙම රෝගය ව්‍යාප්තවී ඇති බවට හඳුනාගෙන ඇත.

03. සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශය මඟින් සිදු කළ වසංගත රෝග විද්‍යාත්මක හා පාරිසරික විමර්ශන මඟින් පොකුරු වශයෙන් මෙන් ම තැනින් තැන වාර්තා වන රෝගීන් ද හඳුනාගෙන ඇති අතර, මෙම රෝගීන් අතර, පාසල් සිසුන් වැඩි වශයෙන් වාර්තා වන බව හඳුනාගෙන ඇත. එබැවින් මෙම වෛරසය තවදුරටත් පාසල් සිසුන් අතර ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම අත්‍යවශ්‍ය වේ. සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග ඒකකය මඟින් එන්ටරෝවෛරස් මෙනින්ජයිටිස් රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පාසල් වෙත ලබා දී ඇති පහත සඳහන් උපදෙස් පිළිබඳ ව සියලුම පාසල් හා අධ්‍යාපන ආයතන දැනුම්වත් කරන ලෙස කාරුණික ව දන්වමි.

**රෝගය බෝ වීම**

- දූෂිත ජලය, දූෂිත ආහාර සහ අපිරිසිදු දෑත් මඟින් මුඛ මාර්ගය හරහා
- ශ්වසන බිඳිති සහ රෝගී පුද්ගලයන් සමීප ව ඇසුරු කිරීම මඟින් ශ්වසන මාර්ගය හරහා බෝ වීම සිදු වේ.

**රෝග ලක්ෂණ**

හදිසියේ හට ගන්නා උණ සමඟ පහත දැක්වෙන මොළයේ පටලවල ආසාදන/ප්‍රදාහ ලක්ෂණ එකක් හෝ කිහිපයක් හෝ පැවතිය හැකිය.

- බෙල්ලේ තද බව
- නොසන්සුන් බව / අසහනකාරී බව
- වලිප්පුව / ගැස්ම
- සිහි බුද්ධියේ වෙනස්වීම
  ඉහත රෝග ලක්ෂණ පවතින සිසුන් වෛද්‍ය පරීක්ෂණ සඳහා යොමු කිරීම අවශ්‍ය වේ.

**රෝගය වැළැක්වීම සහ පාලනය**

- සබන් හා ජලය යොදා දෑත් නිතර පිරිසිදු කිරීම, විශේෂයෙන් ආහාර ගැනීමට පෙර සහ වැසිකිළි භාවිතයෙන් පසු සබන් හා ජලය යොදා හොඳින් අත් සේදීම.
- පිරිසිදු ජලය සැපයීම සහ නිසි පරිදි සනීපාරක්ෂක පහසුකම් පවත්වා ගැනීම.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

- වැසිකිළි සහ නිරන්තරයෙන් ස්පර්ශ කෙරෙන පෘෂ්ඨ (දොර අගුලු, කරාම වැනි) නිරන්තරයෙන් පිරිසිදු ව තබා ගැනීම සහ අවම වශයෙන් දවසකට 3 -5 වතාවක් විෂබීජහරණය කිරීම.
- කැස්ස හෝ කිවිසුම් හෝ යාමේ දී මුඛය සහ නාසය ටිෂූ කඩදාසියකින් (tissue)/ලේන්සුවකින් හෝ මුහුණු ආවරණයකින් හෝ වැලමිට නමා ආවරණය කිරීම.
- භාවිත කළ ටිෂූ කඩදාසි ආරක්ෂිතව පියන සහිත භාජන වලට බැහැර කිරීම හා ලේන්සු ආරක්ෂිතව පිරිසිදු කිරීම.
- රෝග ලක්ෂණ ඇති පුද්ගලයින් සමඟ සමීප සම්බන්ධතා පැවැත්වීමෙන් වැළකීම.
- රෝග ලක්ෂණ ඇති සිසුන්ට මුහුණු ආවරණ (masks) භාවිත කිරීම සඳහා පෙළඹවීම.
- පන්ති කාමරවල ප්‍රමාණවත් වාතාශ්‍රයක් පවත්වා ගැනීම. (හැකි සෑම විටම ජනෙල්/දොරවල් විවෘතව තැබීම)
- පන්ති කාමර තුළ සහ ගෘහස්ථ ක්‍රියාකාරකම්වල දී අධික තදබදය වැළැක්වීම.

<u>විශේෂිත පාසල් ක්‍රියාකාරකම් පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු සනීපාරක්ෂක පිළිවෙත්</u>

- දන්සල් සංවිධානය කිරීමේ දී සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග ඒකකය මගින් සකස්කර ඇති "ආරක්ෂිත හා සනීපාරක්ෂක දන්සල්" මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කිරීම.
- ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සම්බන්ධ කර ගැනීමට කටයුතු කිරීම.
- සිසුන් වැඩි වශයෙන් එකතු වන ක්‍රියාකාරකම් සඳහා රෝග ලක්ෂණ පවතින සිසුන් සම්බන්ධ කර ගැනීමෙන් වැළැකීම සඳහා සිසුන් දැනුවත් කිරීම.

<u>පාසල් ආහාර වැඩසටහනෙහි ආහාර සැපයුම්කරුවන් අනුගමනය කළ යුතු සනීපාරක්ෂක පිළිවෙත්</u>

- ආහාර පිළියෙල කිරීමට හා ආහාර පිළිගැන්වීමට පෙර හා වැසිකිළි භාවිතයෙන් පසු දෙඅත් සබන් යොදා හොඳින් පිරිසිදුකර ගැනීම.
- ආහාර පිළියෙල කිරීම සහ සේදීම සඳහා ආරක්ෂිත හා පිරිසිදු ජලය භාවිත කිරීම.
- ආහාර පිළියෙල කරන අයෙකු රෝග ලක්ෂණ පෙන්නුම් කරන්නේ නම් වහා ම ආහාර පිළියෙල කරන කටයුතුවලින් ඉවත් කර හැකි ඉක්මනින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවීම.
- ආහාර පිළියෙල කිරීමට පෙර ආහාර පිළියෙල කරන ස්ථාන, උපකරණ සහ ආහාර ද්‍රව්‍ය හොඳින් සෝදා පිරිසිදු කිරීම.
- පිළියෙල කළ ආහාර සහ පානීය ජලය ගබඩා කිරීම සඳහා හොඳින් පිරිසිදු කළ ආවරණය කරන ලද භාජන භාවිතා කිරීම.

ඒ අනුව පිරිවෙන්/ පාසල්වල දෛනික කටයුතු වල දී සහ අමතර ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ දී මෙම උපදෙස් පිළිබඳ දැඩි අවධානයක් යොමු කරන මෙන් ඔබ පළාතේ සියලු ම පරිවේනාධිපතිවරුන්/ විදුහල්පතිවරුන් දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස කාරුණික ව දන්වමි.

නාලක කලුවැව
ලේකම්

පිටපත්:

1. සියලු ම ගරු ආණ්ඩුකාර ලේකම්වරු - කරු. දැ.ගැ.ස සහ අ.ක.ස.
2. සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරු - කරු. දැ.ගැ.ස සහ අ.ක.ස.
3. සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරු - කරු. දැ.ගැ.ස සහ අ.ක.ස.